ලෝකය ගැන කතා කරමු, බානු, ශිල්පී

දෙවන කොටස

මා යාන්තමට හඳුනන තිදෙනෙකු පිළිබඳව මා දන්නා කරුණු කිහිපයක් එක් කර සන්නස පාඨකයන් වෙනුවෙන් ගෙන්තම් කරගෙන ආ මේ කතාවේ මුල් කොටසින් මම සුචරිත, බානු සහ නිෂ්මි තිදෙනා පිළිබඳව ඉතා සුළු හැඳින්වීමක් මගින් ඔවුනොවුන් එකිනෙකා සම්බන්ධ කර දැක්වුවෙමි. විප්ලවවාදී කොමියුනිස්ට් පක්ෂයේ හිටපු අනු-නායකයෙකු වන මහාචාර්ය සුචරිත ගමිලත් සහ නව සමසමාජ පක්ෂයේ නායක ආචාර්ය වික්‍රමබාහු කරුණාරත්න යනු ට්‍රොට්ස්කිවාදී වාමාංශික දේශපාලනයේ යෙදෙන, රාජ්‍ය මර්ධනයට ලක්වූ, විශ්ව විද්‍යාල ආචාර්යවරුන් දෙදෙනෙකි. වාමාංශිකයෙකු වූ බානු සහ ජවිපෙවාදියෙකු වූ මොහොමඩ් නිෂ්මි දෙදෙනා ජේරාදෙනිය ඉංජිනේරු පීඨයේ යුග දෙකක සිසුවෝ වූහ. ඔවුන් අතර සමාන අසමානකම් එතැනින් අවසාන නොවේ. මේ ලිපියේ ඉදිරි කොටස් වලින් මා අදහස් කරන්නේ ඔවුන් තිදෙනා ගේ දේශපාලනය දෙස දැක්ක දෙකකටත් වඩා පැරණි වූ මගේ සුවිශේෂී අත්දැකීම් මත පදනම් වූ දෘෂ්ටියකින් බලා එමගින් මෙම ලිපියේ මාතෘකාවට මා යොදගෙන ඇති, ලංකාවේ ජාතිකත්ව ගැටළුව නැතහොත් ජාතික ප්‍රශ්නය සහ අපේ මව් බිම අද දිනයේ ද දවා අළු කරමින් පවත්වාගෙන යනු ලබන වර්ගවාදී යුද්ධය හා බැඳුණු දේශපාලනයේ එක් පැතිකඩක් පිළිබඳව විවරණයක් කරන්නයි.

නූතන ලංකා ඉතිහාසයේ ජන වාර්ගික ප්‍රශ්න සෑමදාමත් තිබුණු බව සත්‍යයක් නමුත් 1982 වන විටත් ඒ වන විට උත්සන්න වෙමින් පැවතුන සිංහල-දෙමල දේශපාලන ප්‍රශ්නය විස්තර කිරීම සඳහා නිවරදි සහ නිරවුල් සිංහල වදනක් නොතිබිණ. රාජ්‍ය මට්ටමෙන් ත්‍රස්තවාදී ප්‍රශ්ණයක් ලෙස මෙය හැඳින්වුනද සාමාන්‍ය වහරේ සහ පුවත්පත් ලිපිවල වරෙක මෙය උතුරේ ප්‍රශ්ණය ලෙසද ඇතැම් විටෙක දෙමල ප්‍රශ්ණය ලෙසද හැඳින්විණි. මේවා නිරවුල් යෙදුම් නොවේ. ත්‍රස්තවාදී ප්‍රශ්ණය යන්න සාපේක්ෂ යෙදුමකි. එමෙන්ම එය පොදු යෙදුමක් ද විය. උතුරේ පටන් ගත්ත ද ප්‍රශ්ණය නැගෙ නගිරට ද විහිදෙමින් තිබිණ. දෙමල ප්‍රශ්ණය යන්න ප්‍රශ්ණය එහි එක් පාර්ශවයකට පමණක් සීමා කරයි. එවකට ජවිපෙ මහ ලේකම් ලයනල් බෝපගේ 1982 දී ජේරාදෙනිය ඉංජිනේරු පීඨයේ දී පැවැත්වූ දේශනයේ මාතෘකාව ජාතික ප්‍රශ්ණය නම් විය. ඉංගිරිසියෙන් "එත්නික් ක්වෙස්ෂන්" යන යෙදුම ජාතිකත්ව ගැටළුව යනුවෙන් බුද්ධිමය සංවාද වලදී යොදු ගැනීම ඇරඹුනේ පසු කලෙකදී ය.

නිර්දේශපාලනික සාමාන්‍ය ජනතාව අතරට "ජාතිකත්ව ගැටළුව" වැනි බර වදන් ලේසියෙන් කාන්දු නොවන බව අමුතුවෙන් කිව යුතු නොවේ. මින් වසර කිහිපයකට පසුව 1987 මාර්තුවේ දී මා රාජ්‍ය ආයතනයක සේවයට බැඳුන අළුත එහි පුහුණු කළමනාකරුවෙක් මගේ දෙමල ජාතික සගයෙකු අමතා කොහොමද දැන් ඔබේ ප්‍රශ්ණය? - හවි ඉස් යුවර් ප්‍රොබ්ලම්? - යැයි ඇසීය. මා මිතුරා මෙන්ම එතැන සිටි අප සැම සිතුවේ ඒ මිතුරාගේ පිරිස් කළමනාකරණ අංශයට අදාල යම් කිසි ප්‍රශ්ණයක් ගැන කළ විමසුමක් බවයි. එවැනි දෙයක් නොවූවෙන් මා මිතුරා කුමන ප්‍රශ්ණයක් ද? - වට් ප්‍රොබ්ලම්? - යනුවෙන් පොදුවා විමසූ විට, පුහුණු කළමනාකරු දුන් පිළිතුරෙන් අප සියළු දෙනා මවිතයට පත් කරමින් පැහැදිලි වූයේ ඔහු අසා ඇත්තේ උතුරේ යුද්ධය ගැන බවයි.

බොහෝ දෙනා දන්නා පරිදි 1983 ජූලි මස පසුවන විට උතුරේ ගැටුම් උත්සන්න වී, දකුණේ ජාතිවාදය ඇවිලි මුළු රටම ගිණි ගනිමින් තිබුණි. එවකට තරුණ විශ්ව විද්‍යාල සිසුවන් වූ අපි, රට ගිල ගනිමින් තිබූ මේ ඛේදජනක තත්වය ගැන ඉතා කණගාටුවෙන් සිටියෙමු. අපට කළ හැකිව තිබූ එක් කාර්යයක් වූයේ මේ පිළිබඳව විශ්ව විද්‍යාලය තුල බුද්ධිමත් කතිකාවතක් ඇති කිරීමයි. ඉංජිනේරු පීඨ සමාජ විද්‍යා සංගමය සාමාන්‍යයෙන් සංවිධානය කරන දේශන මාලාව මේ පිළිබඳව යොමු කරන්නට අපි අදහස් කළෙමු.

සමාජ විද්‍යා සංගමයේ 1984 වසරේ ලේකම් ලෙස මා මේ සඳහා මුල්ම ආරාධනාව කළේ මර්ජ් හෙවත් අන්තර් ජනවාර්ගික යුක්තිය සහ සමානාත්මතාවය පිළිබඳ බලවේගයේ සභාපති පෝල් කැස්පර්ස් දේවගැතිවරයාට ය. ඔහු මහනුවර සත්‍යෝදය නමින් මධ්‍යස්ථානයක් පවත්වාගෙන ගිය අතර විවිධ කලා සම්මන්ත්‍රණ යනාදිය මෙහි පැවැත්වුනි. ඉංගිරිසියෙන් පැවැත්වුනු පෝල් කැස්පර්ස් ගේ මෙම දේශනය සඳහා හොඳ සහභාගීත්වයක් තිබුණි. දැනට ඕස්ට්‍රේලියාවේ සිටින ආචාර්ය විලි සේනානායක ද මෙයට ශ්‍රාවකයෙක් ලෙස සහභාගී විය. මගේ මතකයට අනුව තම සංවිධානයේ මතය ඉදිරිපත් කළ පෝල් කැස්පර්ස් කියා සිටියේ ජාතික ප්‍රශ්ණය විසඳීමට හැකිවන්නේ යුද්ධයෙන් නොව අන්‍යෝන්‍ය විශ්වාසයෙන් යුතුව සියළු ජනකොටස් වලට ජීවත් වීමට අවස්ථා වා සැලසීමෙන් පමණක් ය කියාය.



මීට මාස කිහිපයකට පසුව අපි කොළඹ විශ්ව විද්‍යාලයේ ආචාර්ය නලින් ද සිල්වා ගේ දේශනයක් සංවිධානය කළෙමු. මේ කාලයේ දී නලින් ද සිල්වා අප දැනගෙන සිටියේ අද මෙන් වාම විරෝධියෙක් ලෙස නොවේ. ඔහු එදා ප්‍රසිද්ධව සිටියේ ප්‍රධාන වශයෙන් දිවයින පුවත්පත තුලින් ආණ්ඩු විරෝධී, ප්‍රගතිශීලි අදහස් පල කරන විශ්ව විද්‍යාල ඇදුරෙකු ලෙසිනි. එවකට පැවති ජේ.ආර්. ගේ පොලිස් රාජ්‍යයට විරුද්ධව මත පලකරන්නෝ, ඒ අක්ත පත්‍රය නිසාම, අඩු වශයෙන් තරුණ අපේ සිත් සතන් තුල පමණක් හෝ, ප්‍රගතිශීලීන් වූහ. නලින් ද සිල්වා ඔහු ගේ ජාතික චින්තන ප්‍රවාදය (ප්‍රලාපය?) මගේ ලෝකය කෑතිය තුලින් ඉදිරිපත් කළේ මින් තරමක් පසු කලකය.

මා කියවා ඇති විදියට හැත්තෑ ගනන් වල බානු ලා සමග ට්‍රොට්ස්කිවාදී විප්ලවවාදියෙකු ලෙස ජේරාදෙනිය විශ්ව විද්‍යාලයේ කටයුතු කළ නලින් ගේ ඒ වාමාංශික දේශපාලන දිවියෙන් ඔහු දැක්ෂිණාංශයට සංක්‍රාන්ති වෙමින් පැවතුනේ මේ සමයේ දී විය යුතුය. කෙසේ වෙතත් අප නලින් ද සිල්වා ට බාර දුන්නේ පොදුවේ රටේ ඇති ප්‍රශ්ණ හමුවේ තරුණ පරපුර සතු කර්තව්‍යය පිළිබඳ කතා කිරීමයි. මෙයට එක් හේතුවක් වන්නට ඇත්තේ ඒ 1984 වසර ජාතික තරුණ වර්ෂය ලෙස නම් කර තිබීම වැනි සරල හේතුවක් බව මගේ මතකයයි.

අවාසනාවකට මෙන් මේ දේශනයේ දී නලින් ජාතික ප්‍රශ්ණය ගැන යම් විශ්ලේෂණයක් ඉදිරිපත් කළේ ද, එසේ නම් එය කුමක් වී ද යන්න මගේ මතකයෙන් ගිලිහී ඇත. එහෙත් වාසනාවකට මෙන් මේ ලිපිය සඳහා ඔහුගෙ " එද මතවාදය එතරම් අඳුල කරුණක් ද නොවේ. නැවතත් වාසනාවකට මෙන්, මට නලින් පැවසූ එක් කරුණක් නම් හොඳින් මතකයේ ඇත. තම දේශනයේ දී, එවකට පැවති එජාප රජයේ ආයු ක්ෂයවුනු මතු දිනයක ප්‍රගතිශීලි රජයක් පත්වූ විට කළ යුතු ප්‍රථම කාර්යය කුමක්දැයි වාක්‍යාලංකාරයෙන්" සභාවෙන් ප්‍රශ්න කළ ඔහු එයට පිළිතුර ලෙස ඔහුම ප්‍රකාශ කළේ, ඒ නම් අන් කවර කාර්යයක් හෝ නොව එජාපය තහනම් කිරීම බවයි. මේ අපූරු කියමන වැදගත්වන්නේ මේ වන විට ජවිපෙ තහනමට ලක්ව වසරක් පමණ ගතවී තිබුණු නිසාත් පසු කලෙක දී නලින් ද සිල්වා ජවිපෙ හා සමාන මත දරමින් කෙලින්ම නොවුනත් අනියම්ව ජවිපෙ හා සහාග ගතව ක්‍රියා කළ නිසාත් ය. අද පවතින තත්වය තුල නලින් ද සිල්වා වඩාත් අනුගත වන්නේ ජවිපෙ දෙපිළෙන් සෝමවංශ ට වඩා වීරවංශ පිලේ දේශපාලනය සමග බව පෙනේ.

ලයනල් බෝපගේ හෙවත් සන්නස තීරු ලිපි රචක රෝහිත මුණසිංහ ගේ වචනයෙන් "ලයිසා", 1982 දී ජාතික ප්‍රශ්ණය පිළිබඳ ජේරාදෙනිය ඉංජිනේරු පීඨයේ කළ දේශනයෙන් ඉදිරිපත් කළ මතවාදයෙන් ජවිපෙ 1995 වන විට සහමුලින්ම ඉවත් වී සිටියේය. බෝපගේ පක්ෂයෙන් ඉවත් වී සිටි අතර, පක්ෂ තහනමෙන් පසු ජවිපෙ ඔරුව කණපිට හරවා පදිනා ට පටන් ගෙන තිබිණ. " ජාතිවාදීන් ට කප්පම් නොදෙනු! ජනතාවට අයිතීන් දෙනු!!" යනුවෙන් අක්බර් ශාලාව අසල ගම්පොල පාරේ ලොකු අකුරෙන් ලියවිණ. උතුරේ දෙමල ජනතා සටන ප්‍රතිගාමී වන්නේ ඇයි දැයි මට කියා දෙන්නට උපාලි ජයවීර පැය දෙක තුනක් නාස්ති කළේය. නව වසරේ ස්ටැන්ලි ගේ සභාපතිත්වයෙන් යුතුවූ සමාජ විද්‍යා සංගමය විසින් කළ ජාතික ප්‍රශ්ණය පිළිබඳ දේශනයක් සඳහා වූ ආරාධනය දේශකයා එලිදරව්වේය යන හේතුව මත ජවිපෙ විසින් කාරුණිකව ප්‍රතික්ෂේප කරන ලද අතර, යසස් හරහා අප කළ නසසපය ට කළ ආරාධනය බානු විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

> ප්‍රධාන දේශනය අවසානයේ සුපුරුදු පරිදි ප්‍රශ්ණ ඇසීමේ වාරය ඇරඹුනි. ශිෂ්‍යයින් නැගූ ප්‍රශ්ණයකට දෙකකට බානු පිළිතුරු දුන්නේය. ඉන් පසුව නැගිට සිටි අඩි පහමාරක් පමණ උසැති, රවුම් මුහුණකින් යුතු, කොණ්ඩය කොටට කපා සිටි ශිෂ්‍යයා බානු අමතා නැගූ ප්‍රශ්ණය මට දිවි ඇති තුරු අමතක නොවේ. එය මෙසේය.
>
> " එද 1983 ජූලියේ දී ඒකාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් හඳිසි නීතිය යටතේ නව සමසමාජ පක්ෂය තහනම් කළ පසු, සුළු ධනේශ්වර පක්ෂයක තුරුලේ නැලවෙමින්, ආංඩුවට බාර වීමට තරම් ඔබ නිවට වූයේ ඇයි?"

අක්බර් ශාලාව අසල ගම්පොල පාරේ ලොකු අකුරෙන් ලියවිණ. උතුරේ දෙමල ජනතා සටන ප්‍රතිගාමී වන්නේ ඇයි දැයි මට කියා දෙන්නට උපාලි ජයවීර පැය දෙක තුනක් නාස්ති කළේය. නව වසරේ ස්ටැන්ලි ගේ සභාපතිත්වයෙන් යුතුවූ සමාජ විද්‍යා සංගමය විසින් කළ ජාතික ප්‍රශ්ණය පිළිබඳ දේශනයක් සඳහා වූ ආරාධනය දේශකයා එලිදරව්වේය යන හේතුව මත ජවිපෙ විසින් කාරුණිකව ප්‍රතික්ෂේප කරන ලද අතර, යසස් හරහා අප කළ නසසපය ට කළ ආරාධනය බානු විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

මේ දිනවල විශ්ව විද්‍යාලයේ පැවති නීතියට අනුව ශිෂ්‍ය සංගමයක් විසින් පැවැත්වීමට යෝජිත කාර්යයන් සඳහා ලිඛිත අවසරය ලබාගත යුතු විය. මේ සඳහා නියමිත ආකෘති පත්‍රයක් තිබුණු අතර එහි අනෙකුත් විස්තරවලට අමතරව - යෝජිත කාර්යය සඳහා විශ්ව විද්‍යාලයෙන් පිටස්තර අය සහභාගී වන්නේ නම් - ඔවුන් පිළිවද විස්තර ද ඇතුලත් කළ යුතු විය.

බානු ගේ දේශනය පැවැත්වීමට අවසර ගනු පිණිස, අපේ ලේකම් දර්ශක විසින් නිසි ලෙස පුරවා බාරදෙන ලද මේ ඉල්ලීමට අවසන් දිනයේ ද අවසර ලැබී නොතිබුනි. අපි නීති ගරුක සිසුවන් ලෙස දේශනය කල් දැමීමට තීරණය කළෙමු. නමුත් ඒ බව ඔහුට කල්වේලා ඇතුව දන්වන්නට ක්‍රමයක් නොතිබුනු බැවින් - අප සතුව බානු ගේ දුරකතන විස්තර යනාදිය නොතිබුනි - මා ඉංජිනේරු පීඨයේ රොකට් එන්ජිම අසල දැන්වීම් පුවරුවේ අලවා තිබූ දේශනය පිළිබඳ දැන්වීම හරහා " කල් දමන ලදී!" යනුවෙන් ලියූ තීරුවක් අලවමින් සිටියදී ම බානු එම ස්ථානයට පැමිණි අයුරු මගේ මතකයේ ඇත. උද්ගත වී ඇති තත්වය ගැන මගෙන් දැනගත් බානු, ඔහු දැක එතැනට පැමිණ තම පැරණි සගයන් සමග ජ්‍යෙෂ්ඨ පොදු කාමරය දෙසට ගියේය. මේ වන විට බානු තම නිල නිවසේ 1978 ව්‍යවස්ථාවට එරෙහිව කළු කොඩියක් එසවූ වරදට ලැබුනු සේවය අත්හිටුවීමේ දඬුවම නිෂ්ප්‍රභා වී තිබුනුමුත් ස්වකැමැත්තෙන් ම පූර්ණකාලීන දේශපාලනය උදෙසා තම කථිකාචාර්ය පදවියෙන් ඉල්ලා අස්වීමේ ලියවිලි බාර දී සිටියේය.

කෙසේ වෙතත්, නිල අවසරය ලැබුනෙන්, මීට සති දෙකකට පමණ පසු එම දේශනය නැවත සංවිධානය කිරීමට සමාජ විද්‍යා සංගමයට හැකිවිය. ජාතික ප්‍රශ්ණය සහ සහ උතුරේ සටන පිළිබඳවත්, පොදුවේ රටේ දේශපාලනය පිළිබඳවත් තම අදහස් බානු ව්‍යවක්තව ඉදිරිපත් කළේය. සියල්ල වෙනස් වෙන ලෝකයේ, ඔහු එද දැක්වූ එම අදහස් අද වසර විසිතුනකට පසුව ද වෙනස් වී ඇති බවක් මට නොපෙනේ. වෙනත් වචනයෙන් කිවහොත් එද රතු කමිස හැඳි සෝමවංශ ලා, වාසුදේවලා අද සුදු කමිස අඳිනමුත්, බානු තවමත් තම රතු කමිසයම අඳී.

ප්‍රධාන දේශනය අවසානයේ සුපුරුදු පරිදි ප්‍රශ්ණ ඇසීමේ වාරය ඇරඹුනි. ශිෂ්‍යයින් නැගූ ප්‍රශ්ණයකට දෙකකට බානු පිළිතුරු දුන්නේය. ඉන් පසුව නැගිට සිටි අඩි පහමාරක් පමණ උසැති, රවුම් මුහුණකින් යුතු, කොණ්ඩය කොටට කපා සිටි ශිෂ්‍යයා බානු අමතා නැගූ ප්‍රශ්ණය මට දිවි ඇති තුරු අමතක නොවේ. එය මෙසේය.

" එද 1983 ජූලියේ දී, ඒකාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් හඳිසි නීතිය යටතේ නව සමසමාජ පක්ෂය තහනම් කළ පසු, සුළු ධනේශ්වර පක්ෂයක තුරුලේ නැලවෙමින්, ආංඩුවට බාර වීමට තරම් ඔබ නිවට වූයේ ඇයි?"

සභාවේ සිටි බොහෝ දෙනා තුෂ්ණිම්භූත වූවාට සැක නැත. ඒ, මේ ප්‍රශ්ණය සහ එය ඇසූ විලාශය, තවමත් මාධ්‍ය නිදහස නැති චීනය වැනි රටක රාජ්‍ය පුවත්පත් සාක්ෂිශාලක දී ඇතැම් බටහිර පුවත්පත් කලාවේදියෙකු නගන පෙරලිකාර ප්‍රශ්ණයක් බඳු වූ නිසාය. වසර කිහිපයකට පෙර ඉන්දුනීසියාවේ දී සුහර්තෝ කට්ටුව බලයෙන් පහවූ අළුත පැවති පුවත්පත් සාක්ෂිශාවදී මෙවැනි ප්‍රශ්ණයක් නැගුණු කල, එහි සිටි දේශීය මාධ්‍යවේදීන් සිහි මූර්ඡා නොවුනා පමණි. ඔවුන් සාමූහිකව නැගූ විශ්මයජනක හඬ අපූරු එකක් විය.

එද ඒ සභාවේ සිටි අප විශ්මිත වූයේ ප්‍රධාන වශයෙන්ම, ඒ ප්‍රශ්ණයේ මූලික අරුත කෙසේ වෙතත්, එහි වදන් වැලේ සහ ඇසූ ස්වරයේ අනිවාර්යයෙන්ම දැඩි දේශපාලනික මඩ ගැසීමක් අඩංගු වී තිබුනු නිසාය. ඒ සමගම, දේශනය පැවැත්වූයේ අප උදේ හවා ගැවසෙන සාමාන්‍ය දේශන ශාලාවක විමත්, දේශකයා ද අපේම හිටපු ආචාර්යවරයෙක් විමත් අපේ සිත් තුල ඒ ප්‍රශ්ණය ඇසූ විලාශයේ තිබූ නුනුරු සහ නොග දැලපෙන බව ඉස්මතු කර දක්වන්නට ඇත.

එද ඒ ප්‍රශ්ණය බානු ගෙන් ඇසුවේ, මගේ මේ ලිපියේ මාතෘකාව සරසන තුන්වන නාමය හිමි මොහොමඩ් නිෂ්මි නම් වූ ප්‍රථම වසර ශිෂ්‍යයා විය. කොල කැබැල්ලක ලේඛන ශෛලයෙන් ලියූ එම ප්‍රශ්ණය එය බලමින් පුනරුච්ඡාරණය කරන්නේ නිෂ්මි බව වටහා ගත් මොහොතේ මට සිතුනේ මේ අසරණ ප්‍රථම වසර සිසුවා කාගේ හෝ දේශපාලන බළල් අතක් වී ඇති බවයි.

එය එසේ නොව, නිෂ්මි යනු ජවිපෙ කාඩරවරයෙක් බව පසුව මට අවබෝධ විය. ඇත්ත වශයෙන්ම මින් වසර තුනකට පමණ පසු කාලයේ ඔහු ජේරාදෙනිය සරසවිය තුල ප්‍රසිද්ධව සිට ඇත්තේ "නිෂ්මි රජා" යන නමිනි. ඒ, දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ, ජාතික ශිෂ්‍ය සටන් මධ්‍යස්ථානයේ සහ ජාතික කම්කරු සටන් මධ්‍යස්ථානයේ බලගතුම අවධියේ දී ය.

නිෂ්මි එද ඇසූ ප්‍රශ්ණයේ සැබෑ අරුත මා දකින හැටි සහ ජාතික ප්‍රශ්ණය පිළිබඳ සිය දේශනයේ දී බහුතර සිංහල ජනතාව විසින් සුළුතර දෙමල ජනතාවට ගෙවිය යුතු යැයි සුචරිත ගමිලත් යෝජනා කල වන්දිය කුමක්දැයි විස්තර කෙරෙන මේ ලිපියේ අවසාන කොටසින් ලබන මස හමුවෙමු.

ර. චන්ද්‍රසූරිය විසිනි
ra.chandra.suriya@gmail.com